# වාර්ෂික වාර්තාව

# 2013

# පෙරවදන

කම්කරු දෙපාර්තමේන්තුවේ 2013 වර්ෂය වෙනුවෙන් වාර්ෂික වාර්තාව ඔබ වෙත සතුටින් ඉදිරිපත් කරමි. වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ මෙහෙවර සංක්ෂිප්තව ඉදිරිපත් කරනු ලබන මෙම ප්‍රකාශනය කම්කරු ක්ෂේත්‍රය හා සම්බන්ධව උනන්දුවක් දක්වන සියළු දෙනාටම ඉතා වැදගත් ප්‍රකාශනයක් වනු ඇතැයි යන්න මාගේ විශ්වාසයයි.

ආයතන තුළ කාර්මික සාමය පවත්වාගෙන යාමට මග පෙන්වීමත්, සේව්‍ය සේවක නොසන්සුන්තාවයන් හටගන්නා අවස්ථාවන්හිදී ඒවා සමථකරණය කිරීමත්, අවශ්‍ය අවස්ථාවන්හිදී අධිකරණමය ක්‍රියාකාරකම් කෙරෙහි යොමු කිරීමත් තුළින් ජාතික ආර්ථිකයේ වර්ධනය කෙරෙහි දෙපාර්තමේන්තුවේ දායකත්වය මෙම වසර තුළදීද ලබා දීමට හැකිවිය. විශේෂයෙන් පසුගිය දශකයක පමණ කාලසීමාවෙහි රට තුළ විශාල ආන්දෝලනයක් ඇති කළ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කොට විශ්‍රාම ගොස් සිටි සේවකයන් හට පාරිතෝෂික මුදල් නොගෙවීම සම්බන්ධ ගැටළුව අතිගරු ජනාධිපතිතුමන් විසින් කම්කරු දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලැබීය. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අනුමත අර්ථසාධක අරමුදල් අතිරික්ත ශේෂය උපයෝගී කොටගෙන දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාමික සේවකයන් හට පාරිතෝෂික මුදල් ගෙවීම මෙම වසර තුළ සිදු කරන ලද අතර, තවදුරටත් ඉදිරි වර්ෂය තුළදීද ගෙවීම් කටයුතු සිදු කිරීමට සැලසුම් කර ඇත.

දෙපාර්තමේන්තුවේ ප්‍රගති සමාලෝචන කටයුතු කලාපීය මට්ටමින් සිදු කිරීම තුළ දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාලවල නිලධාරීන්ට තමන්ගේ ප්‍රගතිය එම කලාපයේ අනෙකුත් කාර්යාල සමග සසඳා බැලීමේ අවස්ථාව උදා කර දී ඇත. මේ තුළින් තරඟකාරීත්වයක් නිර්මාණය වීමත්, එමගින් සේවාලාභීන්ට වඩාත් ඵලදායී සේවාවක් ලබාදීමටත් හැකිවී ඇත. එසේම ප්‍රාදේශීය කාර්යාලවල අවශ්‍යතා හඳුනා ගැනීමට හැකි වූ අතර, ඒවා සඳහා කඩිනමින් පිළියම් යෙදීමේ හැකියාවද ලැබිණි.

අපේක්ෂිත ඉලක්කයන් ළඟා කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ සෑම අංශයක්ම තම ශක්ති ප්‍රමාණයෙන්, කැපවීමෙන් කටයුතු කළ අතර ඒ සඳහා දායකත්වය ලබා දුන් සියළුම නිලධාරීන්ට මාගේ ප්‍රශංසාව පුද කරමි. එසේම, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය හා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ කොළඹ කාර්යාලය දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා ලබාදුන් දායකත්වය කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

වී.බී.පී.කේ.වීරසිංහ

කම්කරු කොමසාරිස් ජනරාල්

කම්කරු දෙපාර්තමේන්තුව

කම්කරු මහලේකම් කාර්යාලය

කොළඹ 05

# පටුන


| | |
|---|---|
| කම්කරු දෙපාර්තමේන්තුව | 01 - 01 |
| කාර්මික සාමය | 02 - 04 |
| වැටුප් හා සේවා කොන්දේසි | 05 - 06 |
| සමාජ ආරක්ෂණය | 07 - 08 |
| වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍යය | 09 - 10 |
| විශේෂිත ක්ෂේත්‍රයන් | 11 - 12 |
| පොදු පරිපාලනය | 13 - 14 |
| සංඛ්‍යාලේඛණ සංග්‍රහය | 15 - 19 |
| ඇමුණුම | 20 - 20 |

# කම්කරු දෙපාර්තමේන්තුව

සේව්‍ය, සේවක හා රජය යන ත්‍රෛපාර්ශවයන්හි සම්බන්ධතාවය ශක්තිමත්ව පවත්වාගැනීම තුළින් ජාතික ආර්ථිකය ශක්තිමත් කරලීම කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වේ.

**ඉතිහාසය**

ශ්‍රී ලංකාවේ වතුවල සේවය සඳහා අධිරාජ්‍යවාදී පාලකයින් විසින් ශ්‍රී ලංකාවට ගෙන එන ලද ඉන්දියානු ජාතික කම්කරුවන්ගේ සුබසාධනය අරමුණු කරගනිමින් 1923 අංක 01 දරන ඉන්දියානු ආගාමික කම්කරු ආඥා පනතට අනුව, ඉන්දියානු ආගාමික කම්කරු පාලකවරයාගේ දෙපාර්තමේන්තුව පිහිටුවීම තුළින් වර්තමාන කම්කරු දෙපාර්තමේන්තුවේ ආරම්භය සනිටුහන් වේ. ක්‍රමයෙන් ශ්‍රම බලකාය තුළ ස්වදේශීය දායකත්වයේ වැදගත්කම හා ඔවුන්ගේ සුබසාධනයේ අවශ්‍යතාවය හඳුනාගැනීමත් සමඟ සමස්ථ ශ්‍රී ලාංකික සේවක ප්‍රජාවෙහිම සුබසාධනය හා ආරක්ෂාව මෙන්ම සේව්‍ය, සේවක සබඳතාවය තහවුරු කිරීම වෙනුවෙන් කටයුතු කරන ප්‍රමුඛතම ආයතනය බවට කම්කරු දෙපාර්තමේන්තුව පත්විය.

**දැක්ම**

ජාත්‍යන්තර තරඟකාරී ආර්ථිකයක් සඳහා කාර්මික සාමය තහවුරු වූ රටක්

**මෙහෙවර**

කාර්මික සාමය තහවුරු වූ යහපත් වැඩ පරිසරයක් ස්ථාපිත කිරීම තුළින් ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලියට දායක වීම

**වර්තමානය**

1923 සිට ගතවූ වසර 90 තුළ ශ්‍රී ලංකා ව්‍යවස්ථාදායකය විසින් ක්ෂේත්‍රයට අදාලව සම්මත කරන ලද අණපනත් 50ක් ක්‍රියාවට නැංවීම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි. ජාතික ආර්ථිකය තුළ පෞද්ගලික අංශයේ දායකත්වය ප්‍රසාරණය වීමත් සමඟ දෙපාර්තමේන්තුවේ කටයුතු පුළුල් වීම තුළ, වර්තමානයේ මෙහි සේවක සංඛ්‍යාව 2,169ක් වී ඇත. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට අනුබද්ධව අංශ 13ක් ක්‍රියාත්මක වේ. ප්‍රාදේශීය පරිපාලනය යටතේ කලාප කම්කරු කාර්යාල 11ක්, දිස්ත්‍රික් කම්කරු කාර්යාල 39ක්, උප කම්කරු කාර්යාල 18ක් හා දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 10ක් ක්‍රියාත්මක වේ.


# කාර්මික සාමය


තිස් වසරක යුද්ධය හමාර කිරීමෙන් පසු සීඝ්‍ර ආර්ථික වර්ධනයක් අපේක්ෂා කරන ශ්‍රී ලාංකික ප්‍රජාව හට එම අරමුණට ළඟා වීමේදී රට තුළ මනා කාර්මික සාමයක් පැවතීම අතිශයින් වැදගත් වේ. එනම්, ආයතන තුළ සේව්‍ය හා සේවක ප්‍රජාව සුහදශීලී වාතාවරණයක් තුළ කටයුතු පවත්වාගෙන යාමත්, වැඩවර්ජන හා ආරවුල්වලින් තොරව දෛනික කටයුතු පවත්වාගෙන යාමත් ආර්ථික සංවර්ධනය ළඟා කර ගැනීම සඳහා ප්‍රමුඛතම සාධකයන් වනු ඇත.

## කම්කරු පරීක්ෂණ

රටෙහි තෘප්තිමත් ශ්‍රම බලකායක් ඇති කිරීම සඳහා කම්කරු පරීක්ෂණ මගින් විශාල පිටුවහලක් ලැබේ. නිරන්තරව සිදු කරන කම්කරු පරීක්ෂණ තුළින් ආයතන තුළ කාර්මික සාමය වර්ධනය වීමට ඉවහල් වන අතර, ඒ මගින් රටේ සමස්ථ ඵලදායීතාවය ඉහළ යාම ද සිදු වේ. එමෙන්ම නිසි කම්කරු පරීක්ෂණ ක්‍රියාවලියක් සිදු නොවන තත්ත්වයක් තුළදී කාර්මික ආරවුල්, වැඩ වර්ජන සහ අඩු ඵලදායීතාවයක් ඇතිවන තත්ත්වයක් උදා වේ.

පහත ප්‍රස්ථාර දෙක මගින් පසුගිය වසර 05ක කාලසීමාව තුළ කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් දිවයින පුරා සිදු කරන ලද කම්කරු පරීක්ෂණ සංඛ්‍යාව හා වාර්තා වූ කාර්මික ආරවුල් සංඛ්‍යාව දක්වා ඇත.




වාර්තා වන කාර්මික ආරවුල් ප්‍රමාණය දිගින් දිගටම අඩුවීම මෙම වසර තුළදී ද නිරීක්ෂණය කළ හැකි වේ. කම්කරු පරීක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම, දෙපාර්තමේන්තුවේ සමාජ කතිකා හා වැඩපොළ සහයෝගිතා ඒකකය මගින් ආයතනික මට්ටමෙන් සිදුකරනු ලබන දැනුවත් කිරීම් හා දෙපාර්තමේන්තුවේ අනෙකුත් විවිධ අංශ මගින් ජනමාධ්‍ය තුළින් සිදු කරන දැනුවත් කිරීම් මෙලෙස ආරවුල් පහත යෑමට ප්‍රබල හේතු සාධකයන් වී ඇත.

ආයතනික මට්ටමින් සිදු කරනු ලබන කම්කරු පරීක්ෂණ වල ගුණාත්මකභාවය පිළිබඳව දෙපාර්තමේන්තුව සැලකිලිමත් වේ. මෙම අරමුණෙන් දෙපාර්තමේන්තුව විසින් කලාපීය වශයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වනු ලැබේ. 2013 වර්ෂයේදී මෙවැනි ප්‍රගති සමාලෝචන රැස්වීම් 6ක් පැවැත්වීමට කටයුතු කළ අතර, මෙම රැස්වීම් තුළදී කම්කරු නිලධාරීන්ගේ පරීක්ෂණවල දුර්වලතා හා අඩුපාඩු හඳුනාගෙන, ඒවා නිවැරදි කර ගැනීමට උපදෙස් ලබා දී ඇත.

### වැඩවර්ජන

දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල වෙත වර්ෂය තුළදී පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතන තුළින් වැඩ වර්ජන 42ක් වාර්තා වී ඇත.

එනම්,

- වතු අංශයෙන් 22ක්
- වතු නොවන අංශයෙන් 18ක් හා
- අර්ධ රාජ්‍ය අංශයෙන් 02ක් වශයෙනි.

මෙම සියළු වැඩ වර්ජන සඳහා සේවකයින් 11,119 දෙනෙකු සහභාගී වී ඇති අතර, එතුළින් මිනිස් දින 80,423ක් අහිමි වී ඇත.

### ආරවුල් විසඳීම

දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල ජාලය වෙත කාර්මික ආරවුල් ද ඇතුළත්ව වර්ෂය තුළදී පැමිණිලි 16,320ක් වාර්තා වී ඇත. වර්ෂය ආරම්භයේ පැවති 8,881ක් ද ඇතුළත්ව පැමිණිලි 16,605ක් වර්ෂය තුළදී විසඳීමට කටයුතු කර ඇත.

අතිගරු ජනාධිපතිතුමා, ගරු කම්කරු ඇමතිතුමා හා අමාත්‍යාංශ ලේකම් මගින් කම්කරු කොමසාරිස් ජනරාල් වෙත යොමුවන විශේෂ මහජන පැමිණිලි සම්බන්ධයෙන් වහාම පරීක්ෂණ සිදු කර නීතිමය පියවර ගැනීම දෙපාර්තමේන්තුවේ විශේෂ විමර්ශන අංශය මගින් සිදු කරනු ලබයි. වර්ෂය තුළදී මෙම අංශය මගින් පරීක්ෂණ 122ක් සිදු කර ඇත. මෙම පරීක්ෂණ මගින් සේවක අර්ථසාධක අරමුදල් හිඟ දායක මුදල් රු.28,012,437.11 ක් ගණනය කිරීම සිදු කර ඇති අතර ව්‍යවස්ථාපිත හිඟ මුදල් ගණනය කිරීම රු.5,814,149.90 කි.

## නීති කටයුතු

පසුගිය වසර කිහිපය තුළ දෙපාර්තමේන්තුවේ නීති කටයුතු පිළිබඳව සැලකීමේදී පාරිතෝෂික ගෙවීම් පනත යටතේ පවරන නඩු සංඛ්‍යාව ඉහළ අගයක් ගෙන ඇත. ආසන්න වර්ෂ තුන සමාලෝචනය කිරීමේදී, 2011 වසර තුළ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ නඩු 4,092ක් පැවරීමට කටයුතු කර ඇත. 2013 වසරේදී ද නඩු 2,371ක් මෙම පනත යටතේ පවරා ඇත. මෙම ප්‍රමාණයෙන් වැඩි සංඛ්‍යාවක් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයන් වෙනුවෙන් හිඟ පාරිතෝෂික අයකර දීම සඳහා පවරන ලද නඩු වේ. සේවක අර්ථසාධක හිඟ දායක මුදල් අයකර ගැනීම සඳහා පවරන ලද නඩු සංඛ්‍යාවේ වර්ධනයක් පෙන්නුම් කළ අතර, අංක SC(FR)241/2008 දරන ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව අනුව 2009 හා 2010 වසරවල සේවක අර්ථසාධක හිඟ දායක මුදල් අය කර ගැනීමට පවරන ලද නඩු ප්‍රමාණයෙන් සැළකිය යුතු පසුබෑමක් ඇති විය. කෙසේවෙතත් 2013 වර්ෂය වන විට මෙම නඩු සංඛ්‍යාව නැවත ඉහළ ගිය අතර එය සංඛ්‍යාත්මකව 3,415 කි.

## ශ්‍රී ලංගම පාරිතෝෂික ගෙවීම් කටයුතු

ශ්‍රී ලංකාව පුරා පිහිටි ගමනාගමන මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලවල හා ඩිපෝවල සේවය කොට විශ්‍රාම ගොස් සිටි සේවකයන් වෙනුවෙන් වසර ගණනාවක සිට පාරිතෝෂික මුදල් නොගෙවීම් සම්බන්ධව පැමිණිලි විශාල ප්‍රමාණයක් දෙපාර්තමේන්තුවට වාර්තා වූ අතර, එම පැමිණිලි සම්බන්ධව කටයුතු කොට නඩු පැවරීම දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලදී. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අනුමත අර්ථසාධක අරමුදල් අතිරික්ත මුදලෙන් මෙම හිඟ මුදල් ගෙවීම සඳහා දෙපාර්තමේන්තුවට පැවරීම තුළ 2013 වසර කම්කරු දෙපාර්තමේන්තුවට ඉතාමත් රාජකාරී බහුල වසරක් විය. ඒ අනුව මෙම කටයුතු ගරු කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාගේ මගපෙන්වීම යටතේ දෙපාර්තමේන්තුවේ කාර්මික සම්බන්ධතා අංශය, නීති ක්‍රියා අංශය, මුදල් අංශය ප්‍රමුඛව ප්‍රධාන කාර්යාලයේ අනෙකුත් අංශවල සහයෝගයෙන්ද දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල ජාලයේ මහඟු කැපවීම තුළින් ද සේවකයන් 4,037 දෙනෙක් වෙනුවෙන් රු.1,965,790,382.70 ක මුදලක් ගෙවීමට දෙපාර්තමේන්තුවට හැකිවිය.

# වැටුප් හා සේවා කොන්දේසි

පෞද්ගලික අංශයේ සේවයේ නියුක්ත වුවන්ගේ රැකියා සුරක්ෂිතතාවය හා සුබසාධනය කෙරෙහි බලපාන්නා වු සේවා තත්ත්වයන් හා කොන්දේසි පිළිබඳව ප්‍රමිතීන් සැකසීම හා ඒවාට නෛතික තත්ත්වයන් ලබා දීමට කටයුතු කිරීම හා අධීක්ෂණය කිරීම සඳහා පහත පනත් යටතේ කටයුතු කිරීම මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි.

1. 1941 අංක 27 දරන පඩිපාලක සභා ආඥා පනත.
2. 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත.
3. 2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත.

**පඩිපාලක සභා**

මේ වන විට ශ්‍රී ලංකාව තුළ පඩිපාලක සභා 44ක් ක්‍රියාත්මක වේ. එම පඩිපාලක සභා සම්බන්ධව 2013 වර්ෂය තුළ පහත කටයුතු සිදු කර ඇත.

- පසුගිය වසර තුළ මල්, විසිතුරු පැල, එළවළු හා පලතුරු වගා කිරීමේ හා අපනයනය කිරීමේ පඩි පාලක සභාව පිහිටුවීමෙන් අනතුරුව සේවා වර්ගීකරණ කටයුතු අවසන් කළ අතර, අවම වැටුප් තීරණය කොට ඒ සඳහා විරෝධතා කැඳවීම මෙම වසර තුළදී සිදු කරන ලදී.

- එසේම පෞද්ගලික අධ්‍යාපන ආයතනයන්හි සේවය කරන සේවකයන් සඳහා නව පඩි පාලක සභාවක් පිහිටුවීම සම්බන්ධයෙන් තොරතුරු එක්රැස් කිරීමේ කටයුතු අවසන් කොට එහි ඉදිරි වැඩ කටයුතු වෙනුවෙන් අදාළ ක්ෂේත්‍රයේ විශේෂඥ දැනුම ඇති අයගේ සහභාගිත්වයෙන් වැඩමුළුවක් පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

- නියෝජිතයන්ගේ නිල කාලය අවසන් වූ පඩි පාලක සභා 19ක් සඳහා සහ මියගිය හා ඉල්ලා අස්වූ සාමාජිකයින් වෙනුවට පඩි පාලක සභා 6ක් සඳහා නව නියෝජිතයින් පත් කිරීම සිදු කරන ලදී.

- ඇඳුම් සෑදීමේ කර්මාන්තයේ හා මුද්‍රණ කර්මාන්තයේ නව සේවා කාණ්ඩ හඳුනා ගැනීම සඳහා තොරතුරු රැස්කිරීමේ කටයුතු 2013 වසර තුළදී සිදු කරන ලදී.

- ශ්‍රම ප්‍රමිතීන් පිළිබඳ සේව්‍ය සේවක දෙපාර්ශවය දැනුවත් කිරීමේ අරමුණින් දැනුවත් කිරීමේ වැඩ සටහනක් වරකාපොල තුල්හිරිය ප්‍රදේශයේදී 2014 දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයට සමගාමීව පවත්වන ලදී.

- පඩි පාලක සභා ආඥා පනත, සාප්පු හා කාර්යාල සේවක පනත සහ අයවැය සහන දීමනා පනත යන පනත් වලට අදාළව සේව්‍ය හා සේවක පාර්ශව වෙතින්ද, දිස්ත්‍රික් කම්කරු කාර්යාල මගින්ද යොමු කෙරෙන විමසීම් සඳහා පැහැදිලි කිරීම් ලබාදීම 2013 වර්ෂයේදී ද සිදු කරන ලදී.

**පෞද්ගලික අංශයේ සේවකයන්ගේ අවම වැටුප් මට්ටම් ඉහළ නැංවීම**

පඩි පාලක සභා මගින් ආවරණය වන සේවකයන්ගේ අවම වැටුප් වැඩි කිරීම පිළිබඳ කටයුතු 2012 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර, එම වර්ෂයේදී පඩි පාලක සභා 18ක අවම වැටුප් ඉහළ නැංවීම පිළිබඳ තීරණය කර, එම තීරණ 2013/01/01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රසිද්ධ කරන ලදී. 2013 වර්ෂයේදී තවත් පඩි පාලක සභා 20ක අවම වැටුප් වැඩි කිරීමට කටයුතු සිදු කර, එම තීරණ ද 2013 වර්ෂය තුළදී ප්‍රසිද්ධ කරන ලදී.


# සමාජ ආරක්ෂණය

1958 ජූනි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් අහිමි පෞද්ගලික හා සංස්ථා අංශයේ සේවකයින්ගේ විශ්‍රාම දිවිය සාර්ථක කර ගැනීමට මහඟු අත්වැලක් වීමේ අභිලාෂයෙන් වැදගත් සමාජ ආරක්ෂණ ක්‍රමයක් ලෙස සේවක අර්ථසාධක අරමුදල ස්ථාපිත කරන ලදී. මෙම අරමුදලේ පරිපාලනය කම්කරු කොමසාරිස් විසින් ද මූල්‍ය පාලනය ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ද සිදු කරනු ලබයි.

## දායක මුදල් රැස් කිරීම

පනතින් ආවරණය කරනු ලබන සියලුම සේවකයින් වෙනුවෙන් යම් මාසයක දායක මුදල් අදාල සේවා යෝජකයින් විසින් ඊළඟ මාසයේ අවසන් දිනට හෝ ඊට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවේ තැන්පත් කළ යුතුය. පසුගිය වසර 05ක කාල සීමාව තුළ දායක මුදල් රැස් කිරීමේ ප්‍රගතිය පහත ප්‍රස්තාර සටහනින් දැක්වේ.

| වර්ෂය | දායක මුදල (රු. මිලියන) |
|---|---|
| 2009 | 48,712 |
| 2010 | 54,796 |
| 2011 | 61,879 |
| 2012 | 70,157 |
| 2013 | 77,335 |




## සේවක අර්ථසාධක අරමුදල් හිඟ දායක මුදල් අයකිරීම ස්වයංක්‍රීයකරණය

සේව්‍යයන් විසින් ගෙවීම් පැහැර හරිනු ලබන දායක මුදල් අයකිරීම් අධීක්ෂණ කටයුතු පරිගණකගත කිරීම හා ස්වයංක්‍රීයව වාර්තා ජනනය කිරීමේ කටයුතු මෙම වසර තුළ පරීක්ෂණ මට්ටමින් සිදු කරගෙන යයි. මේ වන විට දිස්ත්‍රික් කම්කරු කාර්යාල 20ක මෙම ක්‍රමය යටතේ කටයුතු ආරම්භ කර ඇත.

### දායක මුදල් ගෙවීම ස්වයංක්‍රීයකරණය

සේව්‍යයන් හට බැංකු ගිණුම් හරහා ස්වයංක්‍රීයව සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල් ගෙවීමේ හැකියාව ලැබෙන පරිදි අවශ්‍ය තාක්ෂණික කටයුතු සිදු කර, රෙගුලාසි සකස් කිරීම පසුගිය වසර තුළ අවසන් කරන ලදී. අදාළ කටයුතු වල මේ වන විට ප්‍රගතිය පහත පරිදි වේ.

| | ලියාපදිංචි සංඛ්‍යාව | විද්‍යුත් ක්‍රමය යටතේ ලියාපදිංචි සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|---|
| සක්‍රීය ආයතන සංඛ්‍යාව | 68,140 | 1,718 | 3% |
| සක්‍රීය සාමාජික සංඛ්‍යාව | 2,337,532 | 799,928 | 34% |

### පෞද්ගලික අර්ථසාධක අරමුදල් අධීක්ෂණය

සේවක අර්ථසාධක අරමුදල් පරිපාලන කටයුතු වලට අමතරව දිවයින පුරා ආයතන 177ක පෞද්ගලික අර්ථසාධක අරමුදල් වල කටයුතු අධීක්ෂණය කිරීමද දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබයි.

# වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍යය

සේවා ස්ථානවල සිදු වන අනතුරු හා ආපදා, වෘත්තීයමය රෝගාබාධ හා රැකියා කටයුතු ආශ්‍රිතව ඇතිවන අයහපත් සෞඛ්‍ය තත්ත්වයන් අවම කිරීම උදෙසා කම්කරු දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ. අනතුරු හා උපද්‍රවවලින් තොර මෙන්ම, වෘත්තීය සෞඛ්‍යය මනාව සුරැකෙන සේවා පරිසරයක් සේවකයන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ඉහළ යාමට මෙන්ම, නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ හා සේවාවල ගුණාත්මකභාවය පවත්වා ගැනීමටද හේතු වන බව නොරහසකි. 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥාපනත අනුව සේවකයන්ගේ සෞඛ්‍යය හා සුරක්ෂිතතාවය නෛතික අවශ්‍යතාවයක් වේ.

### ලෝක සුරක්ෂිතතා දිනය

සෑම වසරකම අප්‍රේල් 28 වන දින ලෝක සුරක්ෂිතතා දිනය සමරනු ලබන අතර, මෙම වසරේ ප්‍රධාන වැඩසටහන කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් බොරලැස්ගමුව කියැන්නෑම් (Keangam) වැඩ බිමේදී පැවැත්වීමට කටයුතු කරන ලදී.

### ජාතික වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍යය පිළිබඳ සතිය

සෑම වසරකම ඔක්තෝම්බර් මස දෙවන සතිය තුළ ජාතික වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍යය පිළිබඳ සතිය පවත්වනු ලබයි. 2013 වර්ෂයේදී මෙම සතිය තුළ විධිමත් හා අවිධිමත් අංශ ආවරණය වන පරිදි පහත වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී.

- කළුතර දිස්ත්‍රික්කයේ රා මැදීමේ කර්මාන්තයේ නිරත වූවන් සුරක්ෂිතතාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන
- කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේ නිලධාරීන් හට පැවැත්වූ දැනුවත් කිරීමේ වැඩසටහන
- පෞද්ගලික ආයතනවල සුරක්ෂිතතා නිලධාරීන් වෙනුවෙන් පැවැත්වූ වැඩසටහන හා පෝස්ටර් චිත්‍ර තරඟාවලියේ ත්‍යාග බෙදා දීම
- බොගවන්තලාව තේ කර්මාන්තශාලා සේවකයන් වෙනුවෙන් පැවැත්වූ දැනුවත් කිරීමේ වැඩසටහන
- මීරිගම ප්‍රදේශයේ ගල්කොරිවල සේවයේ නිරත වූවන් වෙනුවෙන් පැවැත්වූ දැනුවත් කිරීමේ වැඩසටහන

- කොළඹ ගලදාරි හෝටලයේදී පවත්වන ජාතික වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය පිළිබඳ සම්මන්ත්‍රණය
- කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපය තුළ පවත්වන ලද එක්දින දැනුවත් කිරීමේ වැඩසටහන
- කුලියාපිටිය කාර්මික විද්‍යාලයේ පැවැත්වූ දැනුවත් කිරීමේ වැඩසටහන

**නීතිය ක්‍රියාවේ යෙදවීම**

කර්මාන්තශාලා ආඥාපනතේ නීති කඩ කළ සේව්‍යයන් 26 දෙනෙකුට විරුද්ධව 2013 වසරේදී අධිකරණමය ක්‍රියාමාර්ග ගනු ලැබූ අතර, මින් 18 කට වසර තුළදී තීන්දු ලබාගැනීමට හැකිවිය.

**වෘත්තීය ස්වස්ථතාවය**

වෘත්තීයමය රෝගාබාධ ඇතිවිය හැකි සේවා වටපිටාවන් පරීක්ෂා කිරීම සඳහා දෙපාර්තමේන්තුව මඟින් පාරිසරික මිනුම් සිදු කරනු ලබයි. මේ සඳහා දෙපාර්තමේන්තුව සතු සූක්ෂම මිනුම් උපකරණ භාවිතා කරනු ලැබේ. මෙම පරීක්ෂා කිරීම් කටයුතු සම්පූර්ණයෙන්ම නොමිලේ සිදු කෙරේ. සේවා ස්ථානය තුළ සිදු කරනු ලබන පරීක්ෂණ මෙන්ම, නියැදි එකතු කර රසායනාගාරය තුළ සිදු කරන පරීක්ෂණ මඟින්ද මෙම පාරිසරික මිණුම් සිදු කරනු ලබයි. එමෙන්ම, වෘත්තීය රෝගාබාධ හෝ රෝග ලක්ෂණයන් පවතීදැයි මූලික අවදියේදී හඳුනා ගැනීම උදෙසා විවිධ ජීව විද්‍යාත්මක පරීක්ෂණ සිදු කරනු ලබයි. වර්ෂය තුළ,

- පෙනහළු ක්‍රියාකාරීත්වය පිළිබඳ පරීක්ෂණ 157 ක්,
- ශ්‍රවණ පරීක්ෂණ 105 ක්,
- සේවා ස්ථාන තුළ සිදු කරනු ලබන පාරිසරික මිනුම් 230 ක් හා
- පරීක්ෂණාගාරය තුළ සිදු කරනු ලබන පාරිසරික මිනුම් 210 ක් සිදු කර ඇත.

# විශේෂිත ක්ෂේත්‍රයන්

ජාතික ආර්ථිකය තුළ විශේෂ දායකත්වයක් කාන්තා සේවා නියුක්තිකයන් විසින් ඉටු කරනු ලබයි. එම වැඩ කරනු ලබන කාන්තාවන්ගේ වෘත්තීය අයිතිවාසිකම් හා ආරක්ෂාව මෙන්ම, ඔවුන්ගේ සෞඛ්‍යය හා සුබසාධන පහසුකම් සැලසීම පිළිබඳව සොයාබැලීම කම්කරු දෙපාර්තමේන්තුව සතු වගකීමකි. එමෙන්ම ජාතියේ හෙට දිනය භාර ගැනීමට පෙරමං බලා සිටින ළමා පරපුරේ සුරක්ෂිතතාවය තහවුරු කරනු වස්, ළමා ශ්‍රමය පිටුදැකීමේ කර්තව්‍යය වෙනුවෙන්ද දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබයි. වැඩ කිරීම සම්බන්ධව ළමයෙකුගේ වයස තීරණය කිරීම හා ළමයෙකු නොයෙදවිය යුතු අනර්ථකාරී සේවාවන් හා වෙනත් ආකාරයේ අවදානම් සේවාවන්ට ළමුන් යෙදවීම සඳහා ඒ සම්බන්ධව ලැබෙන පැමිණිලි විභාග කිරීම හා අදාළ සේවායෝජකයින් නීතිය ඉදිරියට ගෙන ඒමද කම්කරු දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි.

### ජාත්‍යන්තර කාන්තා දිනය

ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීම නිමිත්තෙන් 2013 මාර්තු මස 08 වන දින පිලියන්දල සුසිරි උත්සව ශාලාවේදී, සේවයේ නියුතු කාන්තාවන් 200 දෙනෙකු දැනුවත් කිරීමේ උපදේශන වැඩසටහනක් පැවැත්වීමට කටයුතු කරන ලදී.

### කාන්තාවන් දැනුවත් කිරීමේ වැඩසටහන්

වැවිලි අංශයේ සේවයේ නියුක්ත කාන්තාවන් දැනුවත් කිරීමේ වැඩසටහන් 20ක් පැවැත්වීමට කටයුතු කරන ලද අතර, කර්මාන්තශාලා සේවිකාවන් දැනුවත් කිරීමේ ආයතනික මට්ටමේ වැඩසටහන් 50ක් පැවැත්වීමට කටයුතු කරන ලදී. ආයෝජන කලාපවල කාන්තා සේවිකාවන්ගේ පෞද්ගලික හා මානසික ගැටළුවලට ආමන්ත්‍රණය කිරීම සඳහා උපදේශන සේවාවන් කටුනායක, බියගම, කොග්ගල හා අවිස්සාවේල්ල කලාප තුළ ක්‍රියාත්මක කරන ලද අතර, මෙවැනි වැඩසටහන් 16ක් පවත්වන ලදී.

### කාන්තා සේවිකා පැමිණිලි හා පරීක්ෂණ

කාන්තා සේවිකා ගැටළු සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි, අදාළ දිස්ත්‍රික් කාර්යාල සමග ඒකාබද්ධව විමර්ශනය කර, අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. ආයතනයන්හි කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමට අවසර ලබාදීම සඳහා දිස්ත්‍රික් කාර්යාල හා ඒකාබද්ධව පරීක්ෂණ 116ක් සිදු කිරීමට කටයුතු කර ඇත. එමෙන්ම කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා ආයතන 315කට අනුමැතිය ලබා දී ඇත. සේවිකාවන්ට හිමි ප්‍රසූතිකාධාර නොගෙවීම් හා අනෙකුත් සේවා කොන්දේසි සැපයීම සම්බන්ධ පැමිණිලි 11ක් ලැබී ඇති අතර, එම පැමිණිලි විභාග කර අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.

### ජාත්‍යන්තර ළමා දිනය හා ළමා ශ්‍රම විරෝධී දිනය

ජාත්‍යන්තර ළමා දිනය සැමරීම වෙනුවෙන් 2013 ඔක්තෝම්බර් මස 01 දින රත්නපුර කුරුවිට මහජන ක්‍රීඩාංගනයේදී ළමයින්, දෙමව්පියන් හා ගුරුවරුන් 700 දෙනෙකුගේ සහභාගීත්වයෙන් ළමා ශ්‍රම විරෝධී පෙරහැරක් පවත්වා, ඉන් අනතුරුව ළමුන්ගේ ගායනා, නාට්‍ය අංග ඇතුළත් උත්සවයක් පවත්වන ලදී. එමෙන්ම ජාත්‍යන්තර ළමා ශ්‍රම විරෝධී දිනය වෙනුවෙන් ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) සමග එක්ව අනර්ථකාරී ළමා ශ්‍රමය පිටුදැකීම සම්බන්ධව මාර්ගෝපදේශන වැඩසටහනක්ද පැවැත්වීමට කටයුතු කරන ලදී.

### ළමා මෙහෙකාර සේවය පිළිබඳ පැමිණිලි හා පරීක්ෂණ

පොලිස් කාන්තා හා ළමා කාර්යාංශය මගින් හා ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය හරහා විවිධ ආයතන හා පුද්ගලයන්ගෙන් නාමිකව හා නිර්නාමිකව ලැබෙන ළමා සේවක පැමිණිලි විභාග කර බැලීම හා එම සේවායෝජකයන්ට විරුද්ධව නීතිමය කටයුතු සිදු කිරීම කම්කරු දෙපාර්තමේන්තුවේ කාන්තා හා ළමා කටයුතු අංශය මගින් සිදු කරනු ලබයි. ඒ අනුව,

- දෙපාර්තමේන්තුව වෙත ලැබුණු පැමිණිලි සංඛ්‍යාව 232
- නීතිමය පියවර ගෙන අවසන් කර ඇති සංඛ්‍යාව 01
- නීතිමය පියවර ගැනීමට කටයුතු කරමින් සිටින සංඛ්‍යාව 04
- ළමා සේවයක් අනාවරණය නොවූ සංඛ්‍යාව 108
- විමර්ශනය වෙමින් පවතින සංඛ්‍යාව 119

### අනර්ථකාරී ළමා ශ්‍රම යෙදවුම තුරන් කිරීම

අනර්ථකාරී රැකියාවන් ලෙස හඳුනාගත් රැකියාවන්හී වයස අවුරුදු 14 - 18ත් අතර ළමුන් සේවයේ යෙදවීම පිටුදැකීම උදෙසා වන මාර්ග සැලැස්ම (Road Map) අනුව දෙපාර්තමේන්තුව විසින් අදාළ කටයුතු ක්‍රියාත්මක කරමින් පවතී. මේ සම්බන්ධව 2013 වර්ෂය තුළදී ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම් 2ක් පවත්වන ලදී. එමෙන්ම සමාජ කොටස්කරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් 20ක්ද පුහුණුකරුවන් (පොලිස්, පරිවාස හා කම්කරු නිලධාරීන්) පුහුණු කිරීමේ වැඩසටහන් 4ක්ද පවත්වන ලදී. අනතුරුදායක රැකියාවල වයස අවුරුදු 14 - 18ත් අතර අය යොදවා ගැනීම පිළිබඳව විශේෂ පරීක්ෂණ 10ක් පැවැත්වීමට කටයුතු කරන ලදී. මීට අමතරව අනර්ථකාරී ළමා ශ්‍රම යෙදවුම හා ළමා ශ්‍රමය පිළිබඳව මුද්‍රණය කළ අත්පොත් දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් මුද්‍රණය කිරීමටද කටයුතු කරන ලදී.

# පොදු පරිපාලනය

සේව්‍ය සේවක ප්‍රජාව වෙත තෘප්තිමත් සේවාවක් ලබා දීම උදෙසා දෙපාර්තමේන්තුවේ භෞතික, මානව හා මූල්‍යමය සම්පත් සංවිධානය කර, ප්‍රශස්ථ ආකාරයෙන් පවත්වා ගැනීම අවශ්‍ය වේ. ඒ අනුව දෙපාර්තමේන්තුවේ පරිපාලනමය කටයුතු සම්බන්ධ කාර්යයන්හි ප්‍රගතිය පහත පරිදි වේ.

**මානව සම්පත**

කම්කරු දෙපාර්තමේන්තුව තුළ විවිධ තනතුරු වල නිලධාරීන් 2,169ක් 2013 වර්ෂය අවසාන වන විට සේවයේ නියුතුව සිටින ලදී. පසුගිය වසර කිහිපය තුළ දෙපාර්තමේන්තුවට නව එකතු වීම් හා දෙපාර්තමේන්තුවෙන් බැහැර වීම් පිළිබඳ විස්තර, සංඛ්‍යාලේඛන සංග්‍රහය තුළ ඉදිරිපත් කර ඇත. වර්ෂය තුලදී දෙපාර්තමේන්තුව යටතේ සේවයට සංචාරක බංගලා භාරකරුවෙක්, රියදුරන් 4 දෙනෙක් හා කාර්යාල සේව්‍ය සේවක තනතුර සඳහා 33 දෙනෙක් බඳවා ගැනීමට කටයුතු කර ඇත. දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන්ගේ හැකියා වර්ධනය උදෙසා සිදු කරනු ලැබූ පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර, සංඛ්‍යාලේඛන සංග්‍රහයෙහි ඉදිරිපත් කර ඇත.

**භෞතික සම්පත් සංවර්ධනය**

මහල් 36කින් යුක්තව ඉදි කිරීමට යෝජිත "මෙහෙවර පියස" ගොඩනැගිල්ලෙහි ජම්බාර ගැසීම (Piling) මේ වන විට අවසන් කර ඇත. 2013 වර්ෂයේ ඔක්තොම්බර් මස අග භාගයේ මෙහෙවර පියස ගොඩනැගිල්ලේ ප්‍රධාන ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත්කරු තෝරා ගන්නා ලද අතර, නොවැම්බර් මාසයේදී ඉදිකිරීම් ආරම්භ කරන ලදී. වර්ෂය තුළ වියදම රුපියල් මිලියන 451.4කි. මීට අමතරව දැනට ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතින ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිලි වල කටයුතු වෙනුවෙන් 2013 වර්ෂය තුළදී පහත සඳහන් පරිදි වියදම් දරා ඇත.

| කාර්යාලය | මුළු වියදම (රු. මිලියන) |
|---|---|
| 1. යාපනය | 18 |
| 2. අවිස්සාවේල්ල | 16 |
| 3. මුලතිව් | 13 |
| 4. පොළොන්නරුව | 12.5 |
| 5. මීගමුව | 22 |
| 6. බෙලිඅත්ත | 13 |
| 7. කිලිනොච්චි | 10 |

**පුස්තකාලය හා කම්කරු කෞතුකාගාරය**

මෙම දෙපාර්තමේන්තුව ප්‍රමුඛ කම්කරු ක්ෂේත්‍රය හා සම්බන්ධ අනෙකුත් ආයතනයන්හි අවශ්‍යතාවයන්ට සරිලන පරිදි විෂයානුබද්ධ තොරතුරු රැස්කිරීම හා අවශ්‍ය අවස්ථාවන් හිදී ඒවා ලබා දීම මගින් ආයතනික සේවකයන්ට හා පොදු මහජනතාවට කම්කරු ක්ෂේත්‍රය පිළිබඳ දැනුම බෙදාදීම කම්කරු දෙපාර්තමේන්තුවේ පුස්තකාලය මගින් සිදු කරනු ලබයි. එමෙන්ම දෙපාර්තමේන්තුව මගින් පවත්වා ගෙන යනු ලබන කම්කරු කෞතුකාගාරය තුළ ශ්‍රී ලංකාවේ කම්කරු ක්ෂේත්‍රයේ විකාශය ආකර්ශනීය ලෙස ඉදිරිපත් කර ඇත. තවද, පැරණි කම්කරු අණපනත් හා කම්කරු ක්ෂේත්‍රයට සම්බන්ධ ලේඛණයන් රැස් කර ඒවා සංරක්ෂණය කිරීම ද කම්කරු කෞතුකාගාරය මගින් සිදු කෙරේ.

**ප්‍රකාශන හා සමීක්ෂණ**

කම්කරු ක්ෂේත්‍රයට අදාල කාලීන හා විශ්වාසනීය දත්ත හා තොරතුරු, සැලසුම් සම්පාදකයන්, පර්යේෂකයින් හා අනෙකුත් දත්ත ප්‍රයෝජනයට ගන්නන් සඳහා සැපයීම පිණිස දෙපාර්තමේන්තුව මගින් පහත සමීක්ෂණයන් සිදු කරනු ලබයි.

- වාර්ෂික රැකිරක්ෂා සමීක්ෂණය.
- සාමාන්‍ය ඉපැයීම් හා වැඩ කළ පැය ගණන පිළිබඳ සමීක්ෂණය.

# සංඛ්‍යාලේඛණ සංග්‍රහය

## කාර්මික සම්බන්ධතා අංශය

| | | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| කාර්මික ආරවුල් පිළිබඳ සංඛ්‍යාලේඛණ | | | | | |
| වාර්තා වූ සංඛ්‍යාව | | 3,948 | 3,756 | 3,702 | 3,204 |
| විසඳූ සංඛ්‍යාව | | 3,462 | 3,384 | 3,695 | 3,077 |
| ලියාපදිංචි කරන ලද සාමූහික ගිවිසුම් සංඛ්‍යාව | | 42 | 66 | 43 | 34 |
| වෘත්තීය සමිති කටයුතු | | | | | |
| ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිති / සම්මේලන | | 107 | 76 | 114 | 108 |
| අවලංගු කරන ලද වෘත්තීය සමිති / සම්මේලන | | 106 | 38 | 02 | 114 |
| කාර්මික අධිකරණ කටයුතු | | | | | |
| අනිවාර්ය බේරුම්කරණයට යොමු කිරීම | | 24 | 69 | 43 | 49 |
| ප්‍රධාන නිකුත් කිරීම | | 29 | 35 | 26 | 35 |
| වැඩ වර්ජන වාර්තා වීම පිළිබඳ සංඛ්‍යාලේඛණ | | | | | |
| වැඩ වර්ජන වාර්තා වීම | වතු | 09 | 14 | 14 | 22 |
| | ආයතන | 06 | 07 | 20 | 20 |
| සහභාගි වූ සේවක සංඛ්‍යාව | වතු | 3,185 | 2,713 | 4,338 | 5,031 |
| | ආයතන | 1,923 | 3,742 | 5,626 | 6,088 |
| අහිමි වූ මිනිස් දින ගණන | වතු | 23,037 | 9,877 | 25,043 | 41,669 |
| | ආයතන | 2,034 | 15,543 | 10,774 | 38,754 |
| සේවය අවසන් කිරීමේ අංශයේ කටයුතු | | | | | |
| පැමිණිලි යොමු වූ සංඛ්‍යාව | | 110 | 86 | 92 | 134 |
| පැමිණිලි විසඳූ සංඛ්‍යාව | | 175 | 111 | 143 | 112 |
| සේවය අවසන් කිරීම සම්බන්ධ ඉල්ලුම්පත් සම්බන්ධයෙන් අවසර දීම | | 25 | 29 | 31 | 41 |
| සමාජ කතිකාවත පිළිබඳ වැඩසටහන් පැවැත්වීම | | | | | |
| සමාජ කතිකා අංශය මඟින් | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | 86 | 98 | 153 | 107 |
| | සහභාගි වූ සේවක සංඛ්‍යාව | 4,041 | 4,864 | 4,751 | 6,560 |
| දිස්ත්‍රික් හා උප කාර්යාල මඟින් | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | 100 | 124 | 225 | 214 |
| | සහභාගි වූ සේවක සංඛ්‍යාව | 3,496 | 4,478 | 7,902 | 7,768 |

2013/12/31 දින වන විට ක්‍රියාත්මක වෘත්තීය සමිති ගණන - 2,145

2013/12/31 දින වන විට ක්‍රියාත්මක වෘත්තීය සමිති සම්මේලන ගණන - 26

**නීති ක්‍රියා අංශය**

| පනත | ගොනු කළ නඩු සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | 2010 | 2011 | 2012 | 2013 |
| 01. පාරිතෝෂික ගෙවීම් පනත | 2,459 | 4,092 | 3,404 | 2,371 |
| 02. කාර්මික ආරවුල් පනත | 59 | 72 | 77 | 126 |
| 03. සේවය අවසන් කිරීමේ පනත | 39 | 65 | 59 | 58 |
| 04. පඩිපාලක සභා ආඥා පනත | 166 | 238 | 290 | 203 |
| 05. සාප්පු හා කාර්යාල සේවක පනත | 51 | 80 | 132 | 112 |
| 06. ප්‍රසූතිකාධාර ආඥාපනත | - | 01 | 02 | 05 |
| 07. ස්ත්‍රීන් තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ පනත | 15 | 05 | 10 | 07 |
| 08. සේවක අර්ථසාධක අරමුදල් පනත | 1,484 | 3,483 | 3,210 | 3,415 |
| 09. කම්කරු විනිශ්චය සභා නියෝග | 134 | 153 | 165 | 144 |
| 10. අයවැය සහන දීමනා පනත | - | 54 | 134 | 22 |
| 11. අනුමත අර්ථසාධක අරමුදල් | - | - | 07 | 01 |

**විශේෂ විමර්ශන අංශය**

| | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|
| පැමිණිලි පරීක්ෂණ | 401 | 241 | 264 | 122 |
| ගණනය කරන ලද සේ.අ.අ. හිඟ වටිනාකම (රු. දහස්) | 31,498 | 153,483 | 313,770 | 28,012 |
| ගණනය කරන ලද හිඟ ව්‍යවස්ථාපිත මුදල් වටිනාකම (රු. දහස් ) | 10,798 | 12,295 | 40,831 | 5,814 |

**සේවක අර්ථසාධක අරමුදල් අංශය**

| | 2010.12.31 දිනට | 2011.12.31 දිනට | 2012.12.31 දිනට | 2013.12.31 දිනට |
|---|---|---|---|---|
| සමස්ත සාමාජික ගිණුම් සංඛ්‍යාව | 13,412,847 | 14,162,590 | 14,559,328 | 15,203,073 |
| මුළු සේවායෝජක සංඛ්‍යාව | 185,647 | 192,044 | 198,893 | 204,777 |
| අරමුදලේ වටිනාකම (රු. මිලියන) | 899,650 | 1,020,072 | 1,144,409 | 1,299,974 |
| සක්‍රීය සාමාජික සංඛ්‍යාව (මිලියන) ∗ | 2.16 | 2.21 | 2.34 | 2.40 |
| සක්‍රීය සේවායෝජක සංඛ්‍යාව ∗∗ | 62,295 | 64,562 | 68,140 | 69,148 |

| | | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| නව ලියාපදිංචි කිරීම් | සේවාදායකයින් | 719,988 | 750,941 | 127,138 | ගණනය කර නොමැත |
| | සේවායෝජකයින් | 5,234 | 6,403 | 10,060 | 7,802 |
| ප්‍රතිලාභ ගෙවීම් | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 104,528 | 120,109 | 115,654 | 114,275 |
| | ගෙවූ ප්‍රතිලාභ මුදල (රු. මිලියන) | 34,896 | 47,311 | 48,015 | 50,062 |
| දායක මුදල් රැස් කිරීම (රු. මිලියන) | | 54,796 | 61,879 | 70,157 | 77,335 |
| සේ.අ.අ. නිවාස ණය | අනුමත කළ අයදුම් පත් සංඛ්‍යාව | 13,848 | 19,709 | 11,182 | 16,268 |
| | අනුමත කළ ණය මුදල් වටිනාකම (රු. මිලියන) | 4,512 | 6,253 | 3,951 | 6,914 |

∗ වර්ෂය තුළ එක් වරක් හෝ දායක මුදල් ගෙවන ලද සාමාජික ගිණුම්

∗∗ වර්ෂය තුළ එක් වරක් හෝ සේවකයන් වෙනුවෙන් දායක මුදල් ගෙවන ලද සේව්‍යයන්

### කර්මාන්තමය සුරක්ෂිතතා අංශය

| | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|
| ලියාපදිංචි කරන ලද මුළු කර්මාන්තශාලා සංඛ්‍යාව (වර්ෂය අවසාන දිනට) | 20,053 | 20,971 | 22,459 | 23,974 |
| සිදු කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව | 4,482 | 4,749 | 6,700 | 6,372 |
| පරීක්ෂකයින් (ඉංජිනේරුවරුන්) සංඛ්‍යාව | 28 | 27 | 28 | 28 |
| පිඹුරුපත් අනුමැතිය | 104 | 122 | 106 | 97 |
| දේශන හා සම්මන්ත්‍රණ | 265 | 294 | 229 | 218 |

### වෘත්තීය ස්වස්ථතා අංශය

| | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|
| කර්මාන්තශාලා පරීක්ෂණ සංඛ්‍යාව | 1,042 | 220 | 410 | 352 |
| දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | 186 | 193 | 137 | 190 |

### සැලසුම් පර්යේෂණ පුහුණු හා ප්‍රකාශන අංශය

| | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|
| මාණ්ඩලික නිලධාරී පුහුණු වැඩසටහන් | 8 | 22 | 4 | 14 |
| කළමණාකරණ සහකාර පුහුණු වැඩසටහන් | 1 | 14 | 8 | 17 |
| පරිගණක පුහුණු වැඩසටහන් | 33 | 16 | 33 | - |
| වෙනත් පුහුණු වැඩසටහන් | 2 | 2 | 2 | 2 |
| පශ්චාත් උපාධි පාඨමාලා | 8 | 26 | 20 | 41 |
| බාහිර පුහුණු | 16 | 37 | 57 | 23 |
| ප්‍රගති සමාලෝචන රැස්වීම් | 8 | 7 | 5 | 6 |
| කම්කරු විගණන | - | 13 | 19 | - |

**මුදල් අංශය**

| | | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|
| පුනරාවර්ථන වියදම් | ප්‍රතිපාදනය (රු.) | 982,340,000.00 | 967,407,000.00 | 1,100,630,000 |
| | වියදම (රු.) | 970,274,622.00 | 953,894,760.00 | 1,016,129,728 |
| ප්‍රාග්ධන වියදම් | ප්‍රතිපාදනය (රු.) | 371,936,197.00 | 372,365,000.00 | 760,275,000 |
| | වියදම (රු.) | 333,633,002.00 | 299,512,890.00 | 732,936,934 |

**ආයතන අංශය**

| | 2011 | 2012 | 2013 |
|---|---|---|---|
| වර්ෂය ආරම්භයේ සිටි මුළු සේවක සංඛ්‍යාව | 2,184 | 2,271 | 2,219 |
| • දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද නව බඳවා ගැනීම් | - | 23 | 1 |
| • ඒකාබද්ධ සේවයේ නව පත්වීම් ලෙස දෙපාර්තමේන්තුවට පැමිණීම් | 159 | 30 | 37 |
| • ස්ථාන මාරු වීම් (ශුද්ධ) | 15 | (7) | (1) |
| • වෙනත් හේතුන් මත දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයට එකතු වීම් | - | 1 | - |
| • විශ්‍රාම යාම් | (67) | (52) | 55 |
| • වෙනත් හේතුන් මත දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයෙන් ඉවත් වීම් | (20) | (47) | 32 |
| වර්ෂය අවසානයේ මුළු සේවක සංඛ්‍යාව | 2,271 | 2,219 | 2,169 |

# ඇමුණුම

## දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය

